# ශ්‍රී ලාංකේය සංස්කෘත සාහිත්‍යය උදෙසා දවුල්දෙණ ඤාණේශ්වර නාහිමිගේ දායකත්වය: විමර්ශනයක්

- ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි

## හැඳින්වීම

සාහිත්‍ය නිර්මාණකරණයේ කුශලතා ප්‍රකට කළ හැක්කේ ලෝකයේ සීමිත පිරිසකට පමණක් බව සාහිත්‍ය සේවනයෙන් පැහැදිලි වේ. ඉනුත් වාගාඩම්බරයෙන් පරිපූර්ණ අතිපෞරාණික සංස්කෘත භාෂාවෙන් නිර්මාණ කළ හැකි වියතුන් සංඛ්‍යාව සීමිත වේ. අද්‍යතන ශ්‍රී ලංකාවේ සංස්කෘත භාෂාවෙන් නිර්මාණකරණයේ යෙදෙන වියතුන් අතර රාජකීය පණ්ඩිත, ග්‍රන්ථ විශාරද, සංස්කෘත චක්‍රවර්ති දවුල්දෙණ ඤාණේශ්වර නාහිමියන්ට ප්‍රමුඛත්වයක් ලැබේ.[1]

වර්තමානයේ උන්වහන්සේ ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ උත්තරීතර මහානායක පදවිය උසුලන අතර උන් වහන්සේගේ භාෂා කුශලතාව, විශේෂයෙන්ම සංස්කෘත භාෂා පටුත්වය උදෙසා විවිධ ආයතන හා සංවිධාන මගින් ගෞරව සම්මාන ප්‍රදානය කොට ඇත. ඒවා නම් මරදාන විද්‍යොදය මහා පිරිවෙණ සංස්කෘත චක්‍රවර්ති ගෞරව සම්මානය, රෝහණ සංඝ සභාව දෛවි භාෂා විශාරද ගෞරව සම්මානය, අමරපුර සිරි සද්ධර්මවංශ මහා නිකායේ එක්නැලිගොඩ පාර්ශ්වය භාෂාන්තර විශාරද ජිනසාසන කීර්ති ශ්‍රී ෂඩ් භාෂා පරමේශ්වර මහා මහෝපාධ්‍යාය ගෞරව සම්මානය, අමරපුර සිරි සද්ධර්මවංශ

07 FEB 2014



මහා නිකාය සංස්කෘත සාහිත්‍ය සරස්වති ගෞරව සම්මානය, ඇමරිකාවේ කැලිපෝනියා සංඝ සභාව සාහිත්‍යශූරී සම්මානය, ආසියානු බෞද්ධ සාම සම්මේලනය සාම රන් පදක්කම , ශ්‍රී ලංකා ජනාධිපති සම්මානය මෙන් ම අනුරාධපුර, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය දර්ශනසූරි උපාධිය ද මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ වෙත පිරි නමා ඇති ගෞරව සම්මාන අතර වේ.[2] මේ ලිපියේ අරමුණ වන්නේ දවුල්දෙණ ඤාණේශ්වර නාහිමියන් විසින් ශ්‍රී ලාඞ්කේය සංස්කෘත සාහිත්‍යය උදෙසා සිදු කළ සාහිත්‍ය සේවය විමසා බැලීමයි.

## ප්‍රවේශය

උන්වහන්සේ විසින් සංස්කෘත භාෂාවෙන් සිදු කළ ශාස්ත්‍රීය සේවාව විමර්ශනයට භාජනය කිරීමෙදී ඒ සඳහා උන්වහන්සේගේ කෘති අංශ කීපයක් යටතේ වර්ග කළ හැක. එනම්

- ධර්ම කාව්‍ය
- දූත කාව්‍ය
- ශතක කාව්‍ය
- ප්‍රශස්ති කාව්‍ය වශයෙනි.

ධර්ම කාව්‍ය මෙසේය.

- වෛරාග්‍යචින්තා
- ධර්මචින්තා
- යශෝධරාචරිතම්
- මහාමහේන්ද්‍රක්ෂීණාශ්‍රවාගමනම්
- සර්වේ සංස්කාරා විපරිණාමධර්මාඃ

දූත කාව්‍ය එකක් පමණි. එනම්

- යතිදූතම්

උන්වහන්සේගේ කාව්‍යයන් අතර ශතක කාව්‍යයට ද විද්වත් ප්‍රසාදයක් ලැබී ඇත. ඒ කාව්‍යයෝ නම්

- මාරාඞ්ගනා විජයම්
- ශ්වානස්තව කාව්‍යම් වශයෙනි.

උන්වහන්සේ විසින් ප්‍රශස්ති කාව්‍ය අතිවිශාල සංඛ්‍යාවක් රචනා කොට ඇත. ඒවා කීපයක් මෙසේය.

- ආශීඃ පුෂ්පමඤ්ජරීඃ
- හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- විදුරපොල ශ්‍රී ප්‍රියතිෂ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- ශ්‍රී ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- ශ්‍රී ජගන්නාථ ගුණානුස්මෘතිඃ
- ශ්‍රී වනරත්න මහානේත්‍රා ප්‍රශස්තිඃ
- මඩිහේ ශ්‍රී ප්‍රඥාසීහ මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- කොස්ගොඩ ශ්‍රී ධර්මවංශ මහා නේතා
- දෙවුන්දර ශ්‍රී වාගීශ්වර නායක ස්වාමීන්ද්‍ර ශුභාශිංසනම්
- තලල්ලේ ශ්‍රී ධර්මානන්ද මහානායක ස්වාමීන්ද්‍ර ගුණානුස්මෘතිඃ
- ස්වස්ති ශ්‍රීරස්තු- වැලිගම ශ්‍රී ඥානරත්න ස්වාමීන්ද්‍ර ශුභාශිංසනම් ආදී වශයෙනි.



## ධර්ම කාව්‍ය

### වෛරාග්‍යචින්තා

බු.ව. 2538 (1995) දී නුගේගොඩ, මොඩර්න් මුද්‍රණාලයේ මුද්‍රණය කොට කර්තෘ ප්‍රකාශනයක් ලෙස එළි දැක්වෙන මේ ග්‍රන්ථයේ පරිච්ඡේද තුනකි. පද්‍ය සංඛ්‍යාව 181 කි. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ග්‍රන්ථ විශාරද උපාධිය[3] සඳහා ඉදිරිපත් කළ මෙය තත් සංගමයේ විද්වත් ප්‍රසාදය ලබමින් ඒ උපාධිය උන්වහන්සේ විසින් හිමි කර ගන්නා ලදි. බුද්ධදේශිත ත්‍රිලක්ෂණ අවබෝධය යථාර්ථාවබෝධය පිණිස (නිර්වාණය) හේතු වන බව පෙන්වීම ග්‍රන්ථ රචනයේ මුඛ්‍ය උද්දේශ්‍ය වේ.[4] ග්‍රන්ථය හැඳින්වීමේදී දවුල්දෙණ ඥානේශ්වර නාහිමියෝ මෙසේ සඳහන් කරති.

"බුදුරදුන් වදාළ නිවන ලැබීමට නම් සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය යථාභූතඥානයෙන් අවබෝධ කර ගත යුතු වෙයි. මේ වෛරාග්‍යචින්තාවේ ත්‍රි ලක්ෂණය වඩන්නෙකුට උපකාර විය යුතු අදහස් ඇතුළත්ව ඇත. මහලු වියේදී නොයෙකුත් කායික මානසික පීඩනයන්ට ගොදුරුවීම අනිවාර්යය. එකුන් අසූ වන වයස ගත කළ මම ද එයින් බැහැර වූවෙක් නොවෙමි"[5]

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ සම්පාදනයේ පූර්වතමයා ලෙස සැලකෙන්නේ ක්‍රි.ව. පළමු සියවසේ පමණ ජීවත් වූ අශ්වඝෝෂ පාදයාණන් වහන්සේය. උන්වහන්සේ විසින් බුද්ධචරිත හා සෞන්දරනන්ද යන මහාකාව්‍ය ද්වය රචනා කරන ලදි. සංස්කෘත භාෂාව වැනි කඨෝර හා වාගාඩම්බරයෙන් යුක්ත භාෂාවකින් කාව්‍යයක් හෝ ධර්ම ග්‍රන්ථයක් රචනා කිරීම සුකර නොවේ. එහෙත් තික්ත රසැති බෙහෙතක් මිහිරි රසින් වෙලා රෝගියාට ලබා දෙන්නා සේ රසවත් ලෙස එම කාර්ය අශ්වඝෝෂ පාදයාණන් මනාව ඉටු කොට ඇත. එම ක්‍රමවේදය ම අනුගමනය කරමින් ඥානේශ්වර මහනාහිමි මේ ග්‍රන්ථ කාර්යය සම්පූර්ණ කොට ඇත.